**04-04-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඇල්ෆා හා බීටා සිහි කිරීමෙන් ඔබට ලොකු වින්දනයක් දැනේවි. පරමාත්ම පියා ඉතාමත් විනෝදජනක කෙනෙක් වන නිසා ඔහුගේ දරුවනුත් විනෝදජනක විය යුතුයි.

**ප්‍රශ්නය:** දේවතා ප්‍රතිමා වලට සෑම කෙනෙක්ම ආකර්ෂණය වන්නේ ඇයි? ඔවුන් තුළ ඇති සුවිශේෂී ගුණධර්මය කුමක්ද?

**පිළිතුර:** දේවතාවරුන් හරිම විනෝදජනක අය වෙනවා සේම හරිම පිරිසිඳුයි. ඔවුන්ගේ එම විනෝදජනක ගති ස්වභාවය නිසා ඔවුන්ගේ රූපත් සෑම කෙනෙකුගේම හිත ඇද ගන්නවා. දේවතාවරුන්ට ඇති සුවිශේෂී ගති ලක්ෂණය නම් පාරිශුද්ධත්වයයි. අපිරිසිඳු මිනිසුන් පවා ඒ ප්‍රතිමා ඉදිරියේ දණ නමන්නේ මෙම විශේෂ ගුණය නිසායි. සෑම දිව්‍යමය ගුණධර්මයක්ම ඇති අයට පමණයි විනෝදජනක සේම නිරන්තර සතුටින් සිටිය හැකි වන්නේ.

ඕම් ශාන්ති. ජීවාත්මයන්ගේ හා පරමාත්ම ජීවයේ මුණ ගැසීම හරිම අපූරු මුණගැසීමකි. ඔබ සෑම කෙනෙක්ම එවන් අසීමිත පියෙකුගේ දරුවන් වන නිසා ඔය දරුවනුත් කෙතරම් විනෝදයෙන් සිටිය යුතුද? දේවතාවරුන් විනෝදජනකයි නේද? කෙසේ වෙතත්, අධිරාජ්‍යය හරිම විශාලයි: සෑම කෙනෙකුටම එකම ලෙසින් විනෝදජනක වෙන්න බැහැ. නමුත් ඇතැම් දරුවන් නම් අනිවාර්යෙන්ම හරිම විනෝදජනකයි. විනෝදයෙන් සිටිය හැක්කේ කාටද? නිරන්තරයෙන් සතුටින් සිටිනා සහ දිව්‍යමය ගුණධර්ම ඇති අයටයි. රාධේ හා ක්‍රිෂ්ණා හරිම විනෝදයෙන් සිටිනා අය නේද? ඔවුන්ගේ ලොකු ආකර්ෂණයක් තිබෙනවා. කුමන ආකර්ෂණය ද? පාරිශුද්ධත්වයේ ආකර්ෂණයයි. මන්ද ඔවුන්ගේ ජීවාත්මයත් ශරීරයත් දෙකම පාරිශුද්ධයි. අපිරිසිඳු ජීවාත්ම පාරිශුද්ධ ජීවාත්මයන්ට ආකර්ෂණය වෙනවා. ඔවුන් ඒ අයගේ පා මුල වැඳ වැටෙනවා. පාරිශුද්ධ ජීවාත්ම තුළ විශාල ශක්තියක් ගැබ් වී තිබෙනවා. සන්‍යාසිවරුන් පවා අනිවාර්යෙන්ම දේවතා පිළිම ඉදිරියේ වැඳ වැටෙනවා. ඇතැම් අය ඉතාමත් අනුවණ අය. ඔවුනුත් අනිවාර්යෙන්ම දේවතා පිළිම හා ශිව ප්‍රතිමා ඉදිරියේ වැඳ වැටෙනවා. දෙවඟනන්ගේ රූප ඉදිරියේ පවා ඔවුන් වැඳ වැටෙනවා. පරමාත්ම පියා විනෝදජනක වන්නාක් සේම ඔහු විසින් නිර්මාණය කළ දේවතාවරුනුත් විනෝදජනකයි. ඔවුන් තුළ එම පාරිශුද්ධත්වයේ ආකර්ෂණය තිබෙනවා. ඔවුන්ගේ එම ආකර්ෂණය අදටත් සෑම කෙනෙක්වම ආකර්ෂණය කර ගන්නවා. තමන් ලක්ෂ්මී හා නාරායන් සේ වෙනවා කියා සිතුවහොත් ඒ අය තරම්ම වූ ආකර්ෂණයක් ඔබ තුළත් තිබිය යුතුයි. මේ කාලයේ ඔබගේ ආකර්ෂණය අවිනාශී වෙනවා. සෑම කෙනෙකුගේම ආකර්ෂණය අවිනාශී වන්නේ නැහැ. එක් එක් මට්ටම් වලින් තිබෙනවා. අනාගතයේදී උසස් තත්ත්වයක් දිනා ගැනීමට සිටිනා අය තුළ එවන් ආකර්ෂණයක් ඇත්තාක් සේ ඒ ජීවාත්ම පාරිශුද්ධයි. ස්මරණ වන්දනාවේ විශේෂයෙන් නිරතව සිටින්නන් තුළ විශාල ආකර්ෂණයක් තිබෙනවා. වන්දනා ගමනකදී අනිවාර්යෙන්ම පාරිශුද්ධත්වය රකිනවා. පාරිශුද්ධත්වය තුළ එම ආකර්ෂණය තිබෙනවා. පාරිශුද්ධත්වයේ එම ආකර්ෂණ ඔබගේ අධ්‍යයනයද ආකර්ෂණීය කරවනවා. එය ඔබ මේ කාලයේදී වටහා ගන්නවා. ඔබ ඔහුගේ රාජකාරිය දන්නවා. ඔවුනුත් ඉතාමත් ඉහළින් පරමාත්ම පියාව සිහි කරන්න ඇති. ඔවුන් ලද රාජධානිය අනිවාර්යෙන්ම ලබන්න ඇත්තේ රාජයෝගාව හැදෑරීමෙනුයි. ඔබ මෙම කාලයේදී මෙහි පැමිණ සිටින්නේ උසස් තත්ත්වයක් දිනා ගැනීමටයි. පරමාත්ම පියා මෙහි සිට ඔබට රාජයෝගාව උගන්වනවා. ඔබ මෙහි පැමිණ සිටින්නේ මෙම කරුණ තදින්ම විවේචනය කරමිනුයි. ඔහු අපගේ ඒ පරමාත්ම පියාම වන්නාක් සේම ඔහු අපගේ ගුරුවරයාත් වෙනවා. ඔහු අපවත් ආපසු ගෙන යාවි. ඔබත් නිරන්තරයෙන් මෙවන් ගුණධර්ම ළඟ තබා ගනිමින් නිරන්තර සතුටින් සිටිය යුතුයි. පරමාත්ම පියා වන ඇල්ෆා ගැන පමණක් සිහි කිරීමෙන් පමණයි ඔබට නිරන්තර උද්යෝගයෙන් සිටිය හැකි වන්නේ. එවිට ඔබට බීටාත් සිහි කර ඉතාමත් සතුටින් සිටිය හැකි වේවි. මෙහිදී තමන් ඉතාමත් විනෝදයෙන් සිටිනා බව ඔය දරුවන් දන්නවා. අනාගතයේදීත් විනෝදයෙන්ම සිටිය හැකි වේවි. මෙම කාලයේ ඉගෙනුම ඔබව අමරණීයත්වයේ දේශය කරා ගෙන යාවි. ඒ සැබෑ බාබා ඔබට සැබෑ ආදායමක් උපයා ගැනීමට උනන්දු කරවනවා. මෙම සැබෑ ආදායම උපත් 21 ක් පුරාවට ඔබත් සමඟම යනවා. පසුව භක්ති මාර්ගයේදී ඔබ උපයනා දේ ඇත්තේ තාවකාලික සතුටකටයි. එය සදාකාලයටම ඔබ හා රැඳෙන්නේ නැහැ. ඔය දරුවන් මෙම ඉගෙනීමෙන් ඉතාමත් ප්‍රවේශම් සහගත විය යුතුයි. ඔබ ඉතාමත් සරළයි. ඒ වගේම ඔබට උගන්වන කෙනාත් පැමිණ සිටින්නේ ඉතාමත් සරළ ස්වරූපයකිනුයි. එමනිසා, ඉගෙන ගන්නා අයත් ඒ ලෙසින්ම සරළ විය යුතුයි. නැතිනම් ඔවුන් ලැජ්ජාවට පත් වේවි. අපි කොහොමද මිලෙන් අධික ඇඳුම් අඳින්නේ? අපේ මාමා බාබා

ඉතාමත් සරළ අය වෙනවාක් සේම අපිත් ඉතාමත් සරළ විය යුතුයි. ඇයි ඔවුන් එතරම්ම සරළව ජීවත් වුණේ? මන්ද ඔවුන් ජීවත් වන්නේ වාම් ගති පැවතුම් මතයි. ඔබලා දැන් නිවහන බලා යා යුතුයි. මෙහි කිසිම කෙනෙක් විවාහ වන්නේ නැහැ. දෙදෙනෙක් විවාහ වීමට සිටිනා විට එම ගැහැණු දරුවා වාම් ජීවිතයක් ගත කරනවා. තම නැන්දම්මාගේ ගෙදරට යාමට සිටිනා නිසා ඇය පැරණි ඇඳුම් ඇඳගෙන ඇඟ පුරා තෙල් තවරාගෙන සිටිනවා. බ්‍රාහ්මණ පූජකවරයෙකු හරහා ඇය විවාහ ගිවිස ගන්නවා. ඔබත් ඔබගේ නැන්දම්මාගේ ගෙදරට යා යුතුයි. රාවණ දේශයෙන් ඔබ රාම දේශයට, එනම් විෂ්ණු දේශයට යා යුතුයි. වාම් ජීවිතයක් ගත කිරීමේ සිරිත පැමිණ ඇත්තේ එවිට තම ශරීරය හෝ ඇඳුම් පැළඳුම් කෙරෙහි අහංකාරයක් නොදැනෙන්නයි. බාල සාරියක් ඇඳ සිටිනා කෙනෙක් හොඳ සාරියක් ඇඳ සිටිනා කෙනෙක්ව දුටුවහොත් ඇගේ සිතේ ඒ පිළිබඳ සිතිවිලි පහළ වෙනවා. ඒ කාන්තාව එතරම් වාම් කෙනෙක් නොවෙයි කියා ඇය සිතාවි. කෙසේ වෙතත් ඔබ සරළ දිවි පෙවෙතක සිටිමින් මෙවන් උසස් ඥානයක් ඉහළ කුල්මත් බවකින් තවත් කෙනෙකුට දානය කළහොත් ඊතලය හරියටම ඉලක්කයට වදීවි. ඔබ වළං පිඟන් සෝද සෝදා සිටින වෙලාවක කෙනෙක් ඔබ ඉදිරියට ආවත් ඒ කෙනාටත් ඇල්ෆාව සිහි කර දීමට ඔබට පුළුවනි. එවන් කුල්මත් බවකින් සරළ ඇඳුමින් පැළඳුමින් සැරසී තවත් කෙනෙකුට දැනුම දුනහොත් මෙතරම් උසස් දැනුමක් ඔබ ළඟ තිබෙනවාදැයි කියා ඔවුනුත් පුදුම වේවි. මෙය දෙවියන් විසින් දී ඇති ගීතාවේ දැනුමයි. එවන් කුල්මත් බවක් ඔබට තිබෙනවාද? බාබා කියන්නේ තමාගේම අත්දැකීමයි. උදාහරණයක් ලෙස කියතොත් මම දරුවන් සමඟ සෙල්ලම් කරමින් සිටිනා විට කවුරු හෝ කෙනෙක් පන්ති ගැනීමට පැමිණියහොත් මම ඉක්මනින්ම ඒ පුද්ගලයාට පරමාත්ම පියාගේ හැඳින්වීම ලබා දෙනවා. ශක්තිය හා යෝග බලය නිසා. ඒ පුද්ගලයා එතනම සිටගෙන මෙතරම් සරළ පුද්ගලයෙක් තුළ මෙතරම් උසස් දැනුමක් තිබෙනවාදැයි කියා පුදුම වී බලාවි. ඔහුට කර කියා ගන්න දෙයක් නැති වේවි. කටින් වචන පිට නොවේවි. ඔබ ශබ්දයෙන් ඔබ්බට යන්නාක් සේම ඔහුත් ඔබ්බට යාවි. මෙම කුල්මත් බව ඔබ තුළ තිබිය යුතුයි. සහෝදරයෙක් සහෝදරියක් පැමිණියහොත් ඔහු හෝ ඇය එතනම හිටුවාගෙන ලෝක පාලකවරයෙක් වීමේ ක්‍රමය ඔවුන්ට පහදා දෙන්න. එවන් කුල්මත් බවක් ඔබගේ ඇතුළාන්තයේ තිබිය යුතුයි. මේ ගැඹුරු සෙනෙහසේ ඔබ ස්ථාවරව සිටිය යුතුයි. බාබා නිතරම කියන්නේ: ඔබට දැනුම තිබුණා වුවත් යෝග බලය නැහැ. පාරිශුද්ධත්වය රැක ගැනීමෙන් හා ස්මරණයේ රැඳී සිටීමෙන් ඔබ බලය වර්ධනය කර ගන්නවා. ස්මරණ වන්දනාවෙන් ඔබ පාරිශුද්ධ වන අතර ඔබට ශක්තියක් ලැබෙනවා. ඥානය ධනය හා සම්බන්ධ කරුණකි. හොඳින් ඉගෙන ගෙන MA හෝ BA විභාගය සමත් වුවහොත් එයට සරිලන වැටුපක් ඔබට ලැබෙනවා. මෙහිදී එය වෙනමම කරුණක්. භාරතයේ පෞරාණික යෝගාව ඉතාමත් ප්‍රසිද්ධයි. මෙය ස්මරණයයි. පරමාත්ම පියා සියලු බල ඇත්තා වන්නාක් සේම ඔය දරුවන් එම පියාගෙන් බලය ලබනවා. තමන් ජීවාත්මයන් බවත් බබාගේ දරුවන් වන බවත් ඔබලා ඇතුළාන්තයෙන් දැනගෙන සිටිය යුතුයි. කෙසේ වෙතත්, ඔබ බාබා සේම පාරිශුද්ධ නැහැ. ඔබ දැන් ඒ තත්ත්වයට පත් විය යුතුයි. මෙය ඔබගේ අරමුණ හා ඉලක්කයයි. යෝගාව තුළින් ඔබ පාරිශුද්ධ වෙනවා. ඉතාමත් සුවිශේෂී ආදරණීය දරුවන් මුළු දවස පුරාම මෙවන් සිතිවිලි ඇතිව සිටීවි. කවුරු හෝ කෙනෙක් පැමිණි විට ඔවුන්ට අනුකම්පා කර පාර පෙන්වා දෙන්න. ඒ අසරණ දිළින්දන් අන්ධයි. අන්ධයින් පාර සොයා ගැනීමට සැරයටියක් භාවිත කරනවා. ඒ සෑම කෙනෙක්ම අන්ධයි. ඥාන ඇස ඔවුන්ට නැහැ. ඔබලා දැන් දැනුම නම් වූ තෙවන ඇස ලබා සිටිනවා. එමනිසා දැන් ඔබ සියල්ලම දන්නවා. අපි දැන් ලෝකයේ මුල, මැද, අග සියල්ලම දන්නවා. ඒ සෑම කරුණක්ම අදාල වන්නේ භක්ති මාර්ගයටයි. නරක දේ අහන්න එපා. දකින්න එපා කියන දේ ඔබ මීට පෙර දැනගෙන සිටියා ද? ඇයි එවන් රූප සාදා ඇත්තේ? ලෝකයේ සිටිනා කිසිම කෙනෙක් එහි අරුත දන්නේ නැහැ. ඔබට දැන් තේරෙනවා. පරමාත්ම පියා දැනුමින් පිරි අයෙක් වූවා සේම ඔහුගේ දරුවනුත් තම තමන්ගේ උත්සාහයේ තරමට දැනුමින් පිරුණු අයයි. ඇතැම් දරුවන් ඉතාමත් ඉහළින් කුල්මත් වෙනවා. අහා. ඔබ බාබාගේ දරුවෙක් වෙලා. නමුත් ඔහුගෙන් මුළු උරුමයම දිනා ගන්නේ නැතිනම් බාබාගේ දරුවෙක් වුණු දවසේ පටන් මොනවාද කර කර සිටියේ. සෑම රාත්‍රියකදීම තම වාර්තාව පරීක්ෂා කර බලන්න. බාබා ව්‍යාපාරිකයායි. ව්‍යාපාරිකයින්ට ගිණුම් තබා ගැනීම හරිම පහසුයි. රජයේ සේවකයින් ගිණුම් තබා ගැනීමට දන්නේත් නැහැ. ගනුදෙනුවක් කරන්නේ කොහොමද කියා දන්නේත් නැහැ. ව්‍යාපාරිකයින් මෙය හොඳින් තේරුම් ගෙන සිටිනවා. ඔබලා ව්‍යාපාරිකයනුයි. තමාගේ ලාභ අලාභ ඔබට තේරුම් ගත හැකියි. සෑම දිනකදීම ඔබගේ ගිණුම් පරීක්ෂා කර බලන්න. තම ගිණුම් බලා කියා ගන්න. තමුන් ලාභ ලබනවාද පාඩු විඳිනවාද කියා බලා දැන ගන්න. ඔබලා ව්‍යාපාරිකයින් නේද? බාබා ව්‍යාපාරිකයා සේම මැණික් වෙළෙන්දා කියාත් කියනවා. ඔහු අවිනාශී ඥාන මිණිමුතු හා ගනුදෙනු කරනවා. ඔබටත් මෙය තේරෙනවා. ඔබ දරනා උත්සාහයේ තරමට සෑම කෙනෙකුටම තියුණු බුද්ධියක් නැහැ. ඔවුන් එක් කණකින් අසා අනිත් කණින් පිට කර හරිනවා. ඔවුන්ගේ සාක්කුවේ

හිලකින් එය රිංගා යනවා. ඒ නිසා සාක්කු පුරවා ගැනීමට ඔවුන්ට හැකි වන්නේ නැහැ. පරමාත්ම පියා කියනවා: දන් දීමෙන් කවදාවත් ධනය හිඟ වෙන්නේ නැහැ. අවිනාශී ඥාන මිණිමුතු මේවායි. පරමාත්ම පියා රූප් හා බසාන්ට් වේ. ඔහුට ජීවාත්මයක් ඇති අතර ඔහු තුළ ඥානය තිබෙනවා. ඔහුගේ දරුවන් වන ඔබලාත් රූප් හා බසාන්ට් වේ. සෑම ඥාන කරුණක්ම පටිගත වී ඇත්තේ ජීවාත්මය තුළයි. ජීවාත්මයක් කෙතරම් කුඩා වුවත්, ඔහුටත් රූපයක් තිබෙනවා. ඔහුට රූපයක් තිබෙනවා නේද? ජීවාත්මයක් අවබෝධ කර ගත හැක්කා සේ පරමාත්ම ජීවයත් අවබෝධ කර ගත හැකියි. මිනිස්සු අමෘතයට අධිපති දෙවියන් වන්දනා කරනවා. නමුත් එවන් කුඩා තාරුකාවක් වන්දනා කරන්නේ කෙසේද? වන්දනා කිරීමටම කියා මිනිස්සු නොයෙකුත් ප්‍රතිමා රාශියක් සාදා ගන්නවා. වහලය තරම් උස ශිව ප්‍රතිමා පවා සාදනවා. ඇත්තටම කියනවා නම් ඔහු ඉතාමත් කුඩායි. නමුත් තත්ත්වයෙන් ඉතාමත් ඉහළයි. යාගහෝම තපස් රැකීම ආදී කිසිම දෙයකින් කිසිම කෙනෙකුට කිසිම දෙයක් ලබා ගත නොහැකි බව පරමාත්ම පියා මීට පෙර කල්පයේදීත් ඔබට කිව්වා. ඒ සියල්ල කිරීමෙන් ඔවුන් එන්න එන්නම පරිහානියට ආද වැටෙනවා: ඉණිමගේ පහළටම බැසගෙන එනවා. දැන් ඔබට ඇත්තේ වර්ධනීය අවධියයි. ඔය බ්‍රහමින්වරුන් අංක එකේ ජිනිවරුනුයි. කිරීමට කුමන හෝ වැඩක් දුන්නේ නැතිනම් සෑම කෙනෙක්වම කා දමන බව කියූ ජිනිවරයෙක් ගැන කතාවක් තිබෙනවා. ඉතින් එම නිසා ඔහුට ඉණිමඟක ඉහළට පහළට යාමට දුන්නා. වැඩන් දුන්නා. බාබාත් ඔබට කියා තිබෙන්නේ: මෙම අසීමිත ඉණිමගේ පහළට පැමිණි පසුව නැවතත් ඉහළ යන බවයි. ඔබ පමණයි ඉණිමගේ පහළටම පැමිණි පසුව ඉහළටම යන්නේ. ඔබලා ජිනිවරුනුයි. වෙන කිසිම කෙනෙක් ඉණිමගේ ඉහළටම යන්නේ නැහැ. මුළු ඉණිමගේම සම්පූර්ණ දැනුම ගෙන ඔබලා එවන් ඉහළ තත්ත්වයක් දිනා ගන්නවා. පහළට පැමිණි ඔබ නැවතත් ඉහළට යනවා. පරමාත්ම පියා කියනවා: මම ඔබගේ පරමාත්ම පියායි. ඔබ මට පාරිශුද්ධකරු කියා කතා කරනවා. මම තමයි සියලු බල ඇත්තා. මගේ ජීවය 100% ක් සදාකාලයටම පිවිතුරුයි. තිතක් වන මම බලයයි. සෑම ග්‍රන්ථයකම සෑම රහසක්ම මම දන්නවා. මෙය මහා පුදුමයක්. මේ සෑම දැනුමක්ම හරිම පුදුමාකාරයි. කවදාවත් මකා දැමිය නොහැකි උපත් 84 ක චරිත කොටසක් ජීවාත්මයේ පටිගත වී ඇති බව ඔබ කවදාවත් දැක නැතිව ඇති. ඔහු දිගින් දිගටම එම චරිතය රඟ දක්වනවා. උපත් 84 චක්‍රය දිගටම කැරකෙනවා. ජීවාත්මයක් උපත් 84 ක පටිගත වීමකින් පිරිලයි තිබෙන්නේ. එවන් කුඩා ජීවාත්මයක් තුළ විශාල ඥාන සම්භාරයක් තිබෙනවා. බාබා තුළ මෙම දැනුම තිබෙන්නාක් සේ ඔය දරුවන්ටත් තිබෙනවා. ඔබ එවන් විශාල චරිත කොටස් රඟ දක්වනවා. එම චරිත කොටස් කවදාවත් මැකී යන්නේ නැහැ. පියවි ඇසින් ජීවාත්මයක් දැකිය නොහැකියි: එය කුඩා තිතකි. බාබා කියනවා: මමත් ඒ වගේම වූ තිතකි. ඔය දරුවන්ට දැන් මෙය තේරෙනවා. ඔබලා අසීමිත අත් හරින්නන් හා රාජඍෂිවරුන් වෙනවා. ඔබ තුළ විශාල කුල්මත් බවක් තිබිය යුතුයි. රාජඍෂීන් මුළුමනින්ම පාරිශුද්ධව සිටිනවා. රාජඍෂිවරුන් සූර්ය වංශය හා චන්ද්‍ර වංශයට අයිති අය වන නමුත් ඔවුන් තම රාජධානිය දිනා ගන්නේ මෙහිදියි. ඔබලා දැන් කරනවා වගේයි. තමන් දැන් යාමට සූදානම්ව සිටිනා බව ඔය දරුවන් දන්නවා. තොටියාගේ බෝට්ටුවේ ඔබ අසුන් ගෙන. මෙය ඉතාමත් සුබම සුබ වූ මංගල සංගම් යුගය කියා ඔබලාත් දන්නවා. ඔබ අනිවාර්යෙන්ම ශාන්ත දේශය හරහා පැරණි ලෝකයෙන් නව ලෝකයට යා යුතුයි. දරුවනි, නිරන්තරයෙන් මෙය ඔබගේ සිහියේ තිබිය යුතුයි. ඔබ ස්වර්ණමය යුගයේ සිටිනා විට, වෙන කිසිම රටක් තිබුණේ නැහැ. අපේ රාජ්‍යය පමණයි තිබුණේ. අපි දැන් නැවතත් වතාවක් යෝග බලයෙන් අපගේ රාජධානිය දිනා ගන්නවා. ලෝක රජදහන දිනා ගත හැක්කේ යෝගා බලයෙන් පමණක් බව පහදා දී තිබෙනවා. භෞතික බලයකින් කිසිම කෙනෙකුට එය දිනාගත නොහැකියි. මෙය අසීමිත නාටකයකි. නාටකය කල් තබාම තීරණය වූවකි. පරමාත්ම පියා මෙම නාටකයේ පැහැදිලි කිරීම ඔබට ඉදිරිපත් කරනවා. ලෝකයේ ඉතිහාසය හා භූගෝලය ඔහු මුල පටන්ම ඔබට කියා දෙනවා. සූක්ෂම කලාපයේ හා අශාරීරික ලෝකයේ රහස් ඔබ ඉතාමත් හොඳින් අවබෝධ කර ගන්නවා. ඔවුන්ගේ රාජධානිය තිබුණේ භෞතික ලෝකයේයි. ඒ අපේ රජදහනයි. තමන් ඉණිමගේ පහළට පැමිණියේ කෙසේද කියා ඔබටත් මතකයි. ඉණිමගේ ඉහළ පහළ යාම ඔය දරුවන්ගේ සිහියේ තිබෙනවා. ලෝක ඉතිහාසය හා භූගෝලය කැරකැවෙන්නේ කෙසේද යන්න දැන් ඔබගේ සිහියේ තිබෙනවා. වීර චරිත අප රඟ දක්වන්නේ මෙහිදියි. පැරදෙන අප නැවතත් ජය ලබනවා. මෙන්න මේ නිසා තමයි අප වීරවරයින් හා වීරවරියන් වන්නේ. අච්චා.

සුමිහිරි, ආදරණීය බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබලා දැන් සිටින්නේ සරල ගති පැවතුම් වලයි. එම නිසා ඔබ ඉතාමත් චාම් විය යුතුයි. ශරීරය හෝ ඇඳුම් පැළඳුම් පිළිබඳ සුළු හෝ අහංකාරයක් නොතිබිය යුතුයි. ඕනෑම ක්‍රියාවක් කරනා අතර, පරමාත්ම පියා සිහි කිරීමේ උසස් කුල්මත් බව ඔබ තුළ තිබිය යුතුයි.
2. ඔබලා අසීමිත අත් හරින්නන් හා රාජඍෂිවරුන් වෙනවා. මෙම කුල්මත් බවින් සිට පාරිශුද්ධ වන්න. ඥාන ධනයෙන් පිරී එය දානය කරන්න. සැබෑ ව්‍යාපාරිකයින් වී ඔබගේ ස්මරණයේ වාර්තාව තබා ගන්න.

**වරදානය:** තමා සේවාධාරියෙක් බව සැලකීමෙන්, ඔබ නිහතමානී-හදවතක් ඇති උපකරණයක් ලෙස හිස නමා, අන් අයටත් හිස නැමීමට දිරිමත් කරත්වා.

තම සෑම සිතිවිල්ලක් සහ ක්‍රියාවක්ම පරම පියාට පුද කරන කෙනෙක් උපකරණයක් බව කියයි. ඔබ උපකරණයක් වීම යනු තමන්ව පුද කිරීමයි, එමෙන්ම හිස නමන ඕනෑම කෙනෙක් නිහතමානී-හදවතක් ඇති කෙනෙකි. ඔබගේ සංස්කාර සහ සිතිවිලි වලින් ඔබ වැඩියෙන් හිස නමන තරමට, ලෝකය ඔබට වඩාත් හිස නමයි. හිස නැමීම යනු, අන් අයට හිස නැමීමට පෙලඹවීමයි. මෙම සිතිවිල්ල නොතිබිය යුතුයි: හොඳයි, අන් අය මට හිස නැමිය යුතුයි. සැබෑ සේවාධාරීන් වන අය සෑම විටම හිස නමයි. ඔවුන් කිසිම විටෙක ලොකුකමක් පෙන්වන්නේ නැත.

**පාඨය:** තව දුරටත් ගැටළු වල ප්‍රතිරූපයක් නොවන්න: විසඳුම් වල ප්‍රතිරූපයක් වන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨත්වයට පත් වීමට මිහිරිබව සහ නිරහංකාරකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

ඔය ශ්‍රේෂ්ඨ ජීවාත්ම තුල සෑම විටම අන් සියළු ජීවාත්ම වෙත මිහිරි සහ ශ්‍රේෂ්ඨ සිතිවිලි තිබිය යුතුයි. සෑම ජීවාත්මයක් වෙනුවෙන් පරම පියාගේ ස්වභාවය නිරන්තරයෙන් හිතකාමීය. ඔහු තුල සානුකම්පිත හැඟීම්, සියළු දෙනාව ඉහළ නැංවීමේ හැඟීම් සහ මිහිරිබවේ සහ නිහතමානිකමේ හැඟීම් තිබේ. එබැවින් ඔබගේ ස්වභාවයද එයට සමාන කරගන්න. තියුණු වචන කතා කිරීමේ හෝ බලය පෙන්වීමේ සංස්කාර තිබීම, බ්‍රහ්මින් ජීවිතයට විශාල බාධකයකි. දැන් එවන් ස්වභාවය පරිවර්ථනය කරන්න.